www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජවාදී සමානතා පක්ෂය ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරනයට ඉදිරිපත් වෙයි

## Socialist Equality Party stands in Sri Lankan presidential election

**සමාජවාදී සමානතා පක්ෂයේ නිවේදනය**
**2005 සැප්තැම්බර් 09**

සමාජවාදී සමානතා පක්ෂය (සසප) එහි ප්‍රධාන ලේකම් විජේ ඩයස්, එලඹෙන ජනාධිපතිවරනයේ සිය අපේක්ෂකයා ලෙස ඉදිරිපත් කරන බව නිවේදනය කරයි.

වැඩකරන ජනතාවගේ අයිතීන් ආරක්ෂා කිරීමටත්, යුද්ධයට, ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එල්ල කෙරෙන ප්‍රහාරයන්ට සහ ජීවන තත්වයන් විනාශ කිරීමට එරෙහිවත් සමාජවාදී ක්‍රියාමාර්ගයක් මත විජේ ඩයස් ඉදිරිපත්වෙයි. කම්කරුවන් හා තරුනයන් අතර මෙන්ම නාගරික හා ගම්බද දුගීන් අතරද ඔවුන් මුහුනපා සිටින ආර්ථික හා සමාජ විනාශයට එරෙහිව සටන් වැදීම සඳහා අවශ්‍ය කෙරෙන ප්‍රතිපත්තීන් පිලිබඳ ව හැකිතාක් පුලුල් පරිමානයෙන් සාකච්ඡාවක් ද විවාදයක්ද සසප ගෙනයනු ඇත.

සසපය ඉදිරිපත් වන්නේ හුදෙක් ශ්‍රී ලංකාව තුල ඡන්දදායකයන් ඇමතීමට පමනක් නොව ආසියානු කලාපයේත් ලෝකය පුරා කම්කරුවන් හමුවේත් සමාජවාදී ඉදිරි දර්ශනයක් හා ක්‍රියාමාර්ගයක් තහවුරු කිරීමේ අවශ්‍යතාව මත පිහිටාය.

ඉන්දියානු උපමහාද්වීපය පුරා සිය පංති සහෝදර සහෝදරියන් මෙන්ම ශ්‍රී ලංකාවේ කම්කරුවන්ද මුහුන දී සිටින ගැටලු පැන නැග ඇත්තේ භූගෝලීය ප්‍රාග්ධනයේ කොල්ලකාරී හැසිරීම විසින් වන අතර මෙම කුඩා දිවයින තුල හෝ කිසිදු ජාතික රාජ්‍යයක සීමාවක් ඇතුලත ඒවාට විසඳුම් ලබා ගත නොහැකිය.

සසප ඉදිරි දර්ශනයේ හරිමැද පවතින්නේ ජාත්‍යන්තරවාදය සඳහා අරගලයයි. ශ්‍රී ලංකාවේ කම්කරු පංතියේ සැබෑ මිතුරන් සොයාගත හැක්කේ කොලඹ බල වැයික්කි තුළ නොව එක හා සමාන සූරාකෑමේ රුදුරු රූපාකාරයන් ද බොහෝ විට එකම ව්‍යාපාරික සූරාකන්නන් ද සමග පොරබදන, ලෝකය පුරා විසිර සිටින කම්කරුවන් අතරිනි. සිය අවශ්‍යතාවන් සඳහා සටන් වැදීමේදී කම්කරු පංතියට භූගෝලීය මූලෝපායක් අවශ්‍ය කෙරේ. එනම්, සුළු පිරිසකගේ ලාභය සඳහා නොව, මනුෂ්‍යවර්ගයාගෙන් බහුතරයකගේ අවශ්‍යතාවන් සපුරා ලීම සඳහා සමාජවාදීමය ලෙස ජාත්‍යන්තර ආර්ථිකයේ දැවැන්ත නිෂ්පාදන බලවේග ප්‍රතිසංවිධානය කිරීමය.

එවන් අරගලයකදී කම්කරුවාට එරෙහිව කම්කරුවා පිහිටුවීමට පසමිතුරු පාලක පැලැන්තීන්ගේ බලය හා වරප්‍රසාද සඳහා මුක්කුවක් ලෙසද ඉන්දියානු උපමහාද්වීපය පුරා දශක ගනනාවක් තිස්සේ අවුලුවනු ලැබ ඇති සෑම ආකාරයකම වර්ගවාදය, ජනඝන වාදය හා කුල වාදය ප්‍රතික්ෂේප කිරීම අවශ්‍ය කෙරේ. ශ්‍රී ලංකාව තුල දූෂ්ඨ ක්‍රියාකලාපයක් ඉටු කර තිබෙන මෙම වර්ගවාදී වසවිස, 60000 කට අධික ජනතාවක ගේ ජීවිත බිලිගත්තා වූ ද දිවයිනේ විශාල ප්‍රදේශයක් විනාශයට පත්කලා වූද ගනන් නැති දහස් ගනනක් අංග විකල හෝ නිවාස අහිමි වූවන් බවට පත්කලාවූ ද විනාශකාරී සිවිල් යුද්ධයටත් මිනීමරු ප්‍රහාරයටත් තුඩුදී තිබේ.

පාලක පංතියේ සියලුම කොටස් මෙම ජනඝාතක යුද්ධය අවසන් කිරීමට මුලුමනින්ම අසමත් බව සනාථ කර තිබේ. එක්සත් ජාතික පක්ෂය (එජාප) ප්‍රමුඛ ආන්ඩුව, දෙමල ඊලාම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමඟ සටන් විරාමය අත්සන් කොට තෙවසරකට වැඩි කලක් ගතවී ඇතත් සාම කතා ඇනහිටය; වැනෙන එකඟතාවය කඩා වැටීමේ අද්දරය. කවුරුන් විසින් කෙරුනද පසුගිය මාසයේදී විදේශ ඇමති ලක්ෂ්මන් කදිරගාමර්ගේ ඝාතනයට පසුව යුද්ධය සඳහා දකුනේ කෙරෙන හඬතැලීම් ද ශ්‍රී ලංකා මිලිටරිය විසින් උතුරු නැගෙනහිර යුද කලාපය තුළ කෙරෙන ප්‍රකෝපකාරි ක්‍රියා ද ඉහල නංවා තිබේ.

මෙම තත්වය තුළ පාලක පැලැන්තිය ප්‍රමුඛ කඳවුරු දෙකම පුලුල් බලතල සහිත ජනාධිපති තනතුරේ පාලනය සියතට ගැනීම සඳහා තරඟයට බැස ඇත.

දැන් සාමයේ නියෝජිතයා ලෙස තෙමේම පෙරමුනට දමාගෙන සිටියද යුද්ධය ආරම්භ කිරීමට ද දශකයකට වැඩි කලක් යුද්ධය ගෙන යෑමට ද වගකිව යුතු එජාපය යි. එහි ජනාධිපති අපේක්ෂක රනිල් වික්‍රමසිංහ 2002 වසරේදී එල්ටීටීඊය සමග සාකච්ඡා ආරම්භ කලේ, සාමාන්‍ය ජනතාව මත යුද්ධයෙන් සිදු වූ විනාශකාරී බලපෑම ගැන උත්සුක වීමෙන් නොව මෙම දිවයින කලාපයේ ආයෝජන දොරටුව බවට පත්කිරීමේ දකුණු ආසියාවේ හොංකොං තිප්පොල බවට පත් කිරීමේ, ව්‍යාපාරික පැලැන්තියේ සැලසුම් වලට යුද්ධය බාධකයක් බවට පත්වීම නිසාය.

ඔහුගේ ප්‍රතිමල්ලවයා වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ (ශ්‍රීලනිප) අපේක්ෂක මහින්ද රාජපක්ෂ, වර්තමාන සටන් විරාමයට මෙන්ම එල්ටීටීඊය සමඟ මොනම

සාකච්ඡාවකට හෝ විරුද්ධ වන ජනතා විමුක්ති පෙරමුන හා ජාතික හෙල උරුමයේ (ජාහෙඋ) සහාය ගොනුකරගැනීමේ යෙදී සිටියි. මෙම පක්ෂ සියල්ලම අඩ සියවසකට වැඩි කලක් තිස්සේ එජාප හා විශේෂයෙන්ම ශ්‍රීලනිප ය රැඳී සිටියාවූ සිංහල අධිපතිවාදයේ අධම දෘෂ්ඨිවාදය පුනරුච්චාරනය කරති. සටන් විරාමය යලි සලකා බැලීමටත් මිලිටරිය ශක්තිමත් කිරීමටත් කරන ඔවුන්ගේ හඬ නැගීම්වල ඒකායන තර්කනය වන්නේ දිවයින යලි යුද්ධයට ඇද දැමීමය.

පාලක කවයන් තුළ බෙදීම් කොතෙක් කර්කෂ වේද යත් මැතිවරනය සඳහා දින නියම කිරීම අර්ථ දැක්වීමට රටේ ශ්‍රේෂ්ඨාධිකරනයට බලකෙරිනි. මේ අතර, තිරය පිටුපසින් මිලිටරියේ කොටස් ද, රාජ්‍ය සංස්ථාපිතය ද සිංහල ස්වෝත්තමවාදී කන්ඩායම් සමග එක්ව භීතිය හා වාර්ගික ආතතීන් ඇවිස්සීම සඳහා වැඩට බැසගෙන සිටිති. එම නිශ්චිත අරමුන සඳහා කදිරගාමර් ඝාතනය සැලසුම් කලෝ ඔවුන් වීමටද හොඳටම ඉඩ තිබේ. ස්ථාවර පාර්ලිමේන්තු ආන්ඩුවක් ඇතිවිය නොහැකි තරම්ය. සියලු ප්‍රධාන පක්ෂවල සමාජ පදනම ගැඹුරු ලෙස ඛාදනය වී තිබීම නිසා පාලක කවයන් තුල මතු වී ඇති විසංවාදයේ මට්ටම සැලකූ විට ජනාධිපතිවරනය පැවැත්වීම හෝ පැවැත්වූවත් ජයග්‍රාහකයාට බලයට ඒමට හැකිවේද යන්න හෝ සැක සහිතය.

ජනගහනයේ බහුතරයකට පලක් නොවූ මෙම සියලු පක්ෂ ප්‍රතික්ෂේප කරන ලෙස සසපය ඉල්ලා සිටියි. වැඩකරන ජනතාවට යුද්ධයේ බර තවදුරටත් ඉසිලිය නොහැකිවාක් මෙන්ම අධිරාජ්‍යවාදී බලවතුන්ගේ තල්ලුව මත සූදානම් කෙරෙන "සාමයද" ඔවුන්ට දැරිය නොහැකිය. එල්ටීටීඊය ද ඇතුලු ඊනියා සාම ක්‍රියාවලියට සම්බන්ධ සියලු පක්ෂ විසින් ගොතනු ලබන්නේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් පාගා දමා කම්කරු පංතිය සූරා කෑම උග්‍ර කරන්නා වූ වෙලඳපොල ප්‍රතිසංස්කරන ක්‍රියාමාර්ගයකට මග හෙලිකරන වාර්ගික බලය බෙදාගැනීමේ වැඩසටහනකි.

වසර ගනනාවක් යුද්ධය ගැන මොනම තැකීමක් වත් නොදැක්වූ වොෂින්ටනය සම්බන්ධයෙන් නම් මේ දිවයිනේ ගැටුම වනාහි, දකුනු ආසියාවේ, විශේෂයෙන්ම එක්සත් ජනපද සමාගම් විසින් වැඩෙමින් තිබෙන සන්නිවේදන කර්මාන්තයෙහි බහුලව ආයෝජනය කරනු ලැබ ඇති දකුනු ඉන්දියාවේ, සිය භූ දේශපාලන අවශ්‍යතාවන්ට තර්ජනයක් වන අස්ථායිකරන සාධකයකි. ඇෆ්ගනිස්ථානය හා ඉරාකය තුල එක්සත් ජනපදයේ සාහසික මිලිටිරි මදාවිය මගින් පැහැදිලි කර ඇත්තේ "සාම ක්‍රියාවලිය" මඟින් සිය අරමුනු ඉටු කරගත නොහැකි වන්නේ නම්, බුෂ් පාලන තන්ත්‍රය ශ්‍රී ලංකාව යලිත් යුද්ධයේ සුලිය වෙත තල්ලු කිරීමට මැලි නොවනු ඇති බවයි.

## සමාජ අසමානතාවයට හා යුද්ධයට එරෙහිව සමාජවාදී ක්‍රියාමාර්ගයක්

ශ්‍රී ලංකාවේද දකුනු ආසියාව පුරාද පැතිර සිටින කම්කරු පංතියට, තම ඉරනම අධිරාජ්‍යවාදී බලවතුන් අත ක්‍රීඩා භාන්ඩයක් වීමට ඉඩදිය නොහැකිය. ජාත්‍යන්තරවද, කලාපය පුරාද, කම්කරු පංතියේ පොදු අවශ්‍යතාවයන් සඳහාත් මහා බලවතුන්ගේ කුටෝපායන්ට එරෙහිවත්, සටන් වැදීම සඳහා බලගතු ප්‍රති ප්‍රහාරයක් සංවිධානය කිරීමේ මාධ්‍යයක් සම්පාදනය කිරීම සසප ජනාධිපතිවරන උද්ඝෝෂනයේ අරමුනයි.

ලෝක දේශපාලනයේ වඩාත්ම පුපුරන සුලු සාධකය වන්නේ, එක්සත් ජනපද යුදවාදයේ නැගීම හා ගෝලීය ආර්ථික හා මූලෝපායික ආධිපත්‍යය සඳහා වන එහි ධාවනයයි. ජවිපෙ හා එල්ටීටීඊ ය ඇතුලු අපගේ සියලුම දේශපාලන විරුද්ධවාදීන් බුෂ් පරිපාලනයේ "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" ද ඇෆ්ගන් හා ඉරාක ජනතාව එයින් මැඬීමද අනුමත කර තිබේ. සසප හා එහි අපේක්ෂකයා ඉරාකයෙන් හා ඇෆ්ගනිස්ථානයෙන් එක්සත් ජනපද හා විදේශ හමුදා කොන්දේසි විරහිතව හා වහාම ඉවත් කල යුතු යයිද වොෂින්ටනයේ යුද අපරාධවලට වගකිව යුත්තන්ට එරෙහිව නඩු පැවරිය යුතු යයිද සිය මැතිවරන උද්ඝෝෂනය තුළ ප්‍රධාන කොටම අවධාරනය කරයි.

ශ්‍රී ලංකාවේ යුද්ධය අවසන් කිරීම සඳහා දිවයිනේ උතුරු හා නැගෙනහිරෙන් ආරක්ෂක හමුදාවන් වහාම හා කොන්දේසි විරහිතව ඉවත් කරගත යුතු බවද සසප අවධාරනය කරයි. ඒකීය රාජ්‍යය බලහත්කාරයෙන් පවත්වාගෙන යාමේ ප්‍රතිඵලය වී ඇත්තේ දෙමල සුලුතරයට එරෙහිව වෙනස්කම් කිරීම පමනක් නොව, මිලිටරි ආධිපත්‍යයද දිවයින පුරා මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට පහරදීම ද තහවුරු කිරීම වෙයි.

කම්කරු පංතිය සියලු වර්ගයේ පීඩාවන්ට එරෙහි විය යුතු අතර, ආගම භාෂාව හෝ ජන වර්ගය නොතකා සියල්ලන්ගේ ම අයිතීන් සඳහා පෙනී සිටිය යුතුය. විසි වසරක සිවිල් යුද්ධය නතර කිරීම කල හැක්කේ ම වර්ගවාදයත් ආඥාදායක විධායක ජනාධිපති ක්‍රමයත් මුල් බැස්සා ඇති ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාව ප්‍රතික්ෂේප කිරීමෙනි. ධනේශ්වර දේශපාලකයන්ගේ කල්ලිවලට නොව, සාමාන්‍ය වැඩකරන ජනතාව විසින් ප්‍රජාතන්ත්‍රීය අයිතීන් පිළිබඳ සියලු නොවිසඳුනු ප්‍රශ්න ගැන තීරන ගත හැකි ඔවුන්ගේ නියෝජිතයන් ගෙන් සැදුම්ලත් අව්‍යාජ ව්‍යවස්ථා සම්පාදක සභාවක් පිහිටුවීම වෙනුවෙන් සසපය පෙනී සිටියි.

ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කිරීම, සමාජ සමානතාවය සඳහා අරගලය සමඟ බැඳී පවතී. එල්ටීටීඊ ය හා ජවිපෙ ද ඇතුළුව සියලුම ධනපති පක්ෂ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේද ලෝක බැංකුවේද ආර්ථික නිර්දේශයන් මගින් හා බාධාවකින් තොරව වෙලඳපොල බලවේග ක්‍රියාත්මක කිරීමෙන් රටේ ආර්ථික හා සමාජ අර්බුදය අවසන්වනු ඇතැයි යන මිථ්‍යාව තොරොම්බල් කරති. ජීවන තත්වයන් වැඩිදියුනු කරනවා වෙනුවට, මෙම න්‍යාය පත්‍රය සම්පාදනය කර ඇත්තේ, ධනවතුන්ද දුගීන්ද අතර ආගාධය තවදුරටත් ගැඹුරු කර නිසැකවන සමාජ සේවාවන් විනාශ කිරීම මෙන්ම මූලික යටිතල පහසුකම් තවදුරටත් පිරිහෙලීම පිනිසයි.

පසුගිය දෙසැම්බර් 26 දින ආසියානු සුනාමියද ඉන්පසු එක්සත් ජනපදයේ කැතරිනා කුනාටුවද

ඇතිකල විනාශයේ බලපෑම විසින් සිත් කම්පාකරවන පරිදි හෙළිදරව්කර ඇත්තේ කම්කරු ජනතාවගේ ප්‍රාථමික අවශ්‍යතාවන් හෝ ඉටුකිරීමට ලාභය පදනම් කරගත් ධනපති ක්‍රමය දක්වන නොහැකියාවයි. නිදහස් වෙළඳපොල ක්‍රියාවලීන් මගින් මිලියන ගනන් ජනතාව ස්වභාවධර්මයේ ඉරනමට අතහැරදමනු ලැබ සිටිති. ඉහත සිදුවීම් දෙකේදීම එක්සත් ජනපද ජනාධිපති ජෝර්ජ් බුෂ්ගේ පටන් ශ්‍රී ලංකා ජනාධිපති කුමාරතුංග දක්වා වූ ධනේශ්වර දේශපාලකයන් ගේ ප්‍රතිචාරයන්, මහජනතාව අත්විඳි දුක්වේදනාවන් සම්බන්ධයෙන් දක්වන නොතැකීම හා පිළිකුල් සහගත භාවයේ දුඟඳින් පිරී ඇත. බෙංගාල බොක්ක වෙරළ තීරයන් විනාශකරමින් ලක්ෂ තුනක ජනතාවට මරු කැඳ වූ සුනාමියෙන් අට මසකට පසුවත් ප්‍රතිසංස්කරන කටයුතු ආරම්භ වී ඇත්තේ මඳ වශයෙනි. ගනන් නැති දස දහස් ගනන් ජනතාව මූලික පහසුකම් වලින් පවා තොරව අන්ත දුක්ඛිත කොන්දේසි යටතේ ජීවත්වෙති.

දකුනු ආසියාවේ මෙන්ම ඇමරිකාවේ දකුනේද ව්‍යසනයට ගොදුරු වූයේ බොහෝ කොටම දුගීන්ය. ඔවුන්ගේ ජීවිත මුලිනුපුටා විනාශ කරනු ලැබුවේ, එවන් මහා පරිමාන විපත්තීන් වැලැක්විය හැකි තාක්ෂනය නොපැවතීම නිසා නොව ධනපති අතලොස්සක් විසින් පුද්ගලික ලාභය වෙනුවෙන් සමාජයේ සම්පත් මත ඒකාධිකාරයක් පවත්වාගෙන යනු ලැබීමේ හේතුව නිසාය. සාගතය, ලෙඩරෝග හා දිළිඳුකම වැනි දුෂ්ඨ සමාජ විපත්තීන් අවසන් කලහැකි තරමින් විද්‍යාවද තාක්ෂනයද දැන් සුවිශාල වර්ධනයක් අත්කරගෙන තිබේ. කම්කරු පංතිය විසින් නිර්මානය කොට තිබෙන ඉමහත් ධන සම්භාරය යෙදවිය යුත්තේ ව්‍යාපාරවල ලාභ තරකිරීමට නොව බහුතරයකගේ දැවෙන සමාජ අවශ්‍යතාවන් සපුරාලීම සඳහා බව සසප අවධාරනය කරයි. සමාජය සමාජවාදී ලෙස ප්‍රතිසංවිධානය කිරීමේ අරගලය සඳහා වැඩකරන ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යටතේ, ප්‍රධාන කර්මාන්ත හා බැංකු ජනසතු කිරීම ද ඇතුලත්, පෞද්ගලික ධනයේ හා වරප්‍රසාදයන්හි වත්මන් බලකොටු තුළට ගැඹුරින් කඩාවැදීමක් අවශ්‍ය කෙරෙයි.

සමාජවාදය සඳහා වූ පලල් අරගලයේ කොටසක් ලෙස, ශ්‍රී ලංකා ඊලාම් සමාජවාදී එක්සත් ජනපදයක් වෙනුවෙන් සසප සටන් වදියි. වැඩකරන ජනතාව තවමත් ජීවත් වන්නේ පැරනි බ්‍රිතාන්‍ය විජිතවාදී පාලකයන් හා දේශීය ධනේශ්වර ප්‍රභූ කොටස් අතර ඇතිකරගත් පශ්චාත් දෙවැනි ලෝක යුද්ධ ප්‍රතිගාමී විසඳුමේ බිහිසුනු ප්‍රතිවිපාකයන්ට මුහුන දෙමිනි. ශ්‍රී ලංකාවේ කෘත්‍රිම රාජ්‍ය කැබැල්ලක් නිර්මානය කිරීමද ඇතුලු ඉන්දියානු උපමහාද්වීපය වාර්ගික පදනමක බෙදා වෙන් කිරීමට තුඩු දුන්නේ එයයි. ධනවාදය අහෝසි කිරීමේ භූගෝලීය අරගලයක කොටසක් ලෙස මෙම කලාපය පුරා විසිරී සිටින කම්කරුවන් ද පීඩිතයන්ද ඒකාබද්ධකර මෙහෙයවීමේ මාධ්‍යයක් වශයෙන් දකුනු ආසියාවේ සමාජවාදී එක්සත් ජනපදයක සටන්පාඨය සසපය විසින් ඉදිරිපත් කෙරෙයි.

ලාභ පද්ධතියට එරෙහි ප්‍රහාරයක් සඳහා අත්‍යාවශ්‍ය පූර්ව කොන්දේසිය වන්නේ කම්කරු පංතියේ දේශපාලන ස්වාධීනත්වයයි. සියල්ලන්ගේම ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කරන එසේම දුප්පත්කමද අවශ්‍යතා සන්තෘප්තියේ අප්‍රමානවත් බවද අවසන් කරන තමන්ගේම සමාජවාදී විසඳුමක් ඉදිරිපත් කිරීම පිනිස සිය අරගලයන් ඒකාබද්ධ කිරීම මගින් කම්කරු පංතියට, නාගරික හා ගම්බද දුගී පීඩිත මහජනතාවගේ ආකර්ශනය දිනාගත හැකි බලවේගයක් බවට පත්විය හැකිය; එමගින් දේශපාලන බලය අත්කරගැනීම ද කම්කරුවන්ගේ හා ගොවීන් ගේ ආන්ඩුවක් පිහිටුවීමද ඉලක්ක කරගත් බලගතු ව්‍යාපාරයක් ගොඩනැගීම සඳහා මූලිකත්වය ගත හැකිය. කම්කරුවන්ට සිය අයිතීන් සඳහා සටන්වැදීමට නව පුලුල් මහජන පක්ෂයක් අවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ, කම්කරු පංතික පැරනි සංවිධාන වන ලංකා සමසමාජ පක්ෂය (ලසසප) කොමියුනිස්ට් පක්ෂය (කොප) මෙන්ම වෘත්තීය සමිති නිලධරයන් කම්කරුවන්ගේ අතිමූලික අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් පවා කමකට නැති බව තහවුරු වී තිබේ. ලසසප හා කොප කටයුතු කරන්නේ ධනපති ශ්‍රී ලනිපයේ බයාදු පරිවාරකයන්ට වැඩිමනත් ලෙසකින් නොවේ.

කම්කරුපංතියේ ඓතිහාසික අවශ්‍යතාවන් අඛන්ඩව ආරක්ෂා කර ඇති එකම පක්ෂය සසපයි. එහි අපේක්ෂක විජේ ඩයස් සමාජවාදී ජාත්‍යන්තරවාදයේ මූලධර්ම සඳහා කල අශමනීය අරගලයක දශක හතරකට වැඩි නොකැලැල් වාර්තාවකට හිමිකම් කියයි. ඔහු ලංකා සමසමාජ පක්ෂය සිරිමා බන්ඩාරනායක මහත්මියගේ ආන්ඩුවට ඇතුල්වීමෙන් ට්‍රොට්ස්කිවාදය ඓතිහාසිකව පාවාදීමට එරෙහිව 1968 දී පිහිටුවනු ලැබූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ (විකොස - සසපයේ පූර්වගාමී) ආරම්භක සාමාජිකයකු හා නායකයකු විය. වාර්ගික දේශපාලනය ගැන විකොස එවකට යලි යලිත් කල අනතුරු ඇඟවීම්, 1983 පැනනැගි ම්ලේච්ඡ සිවිල් යුද්ධයෙන් ඛේදජනක ලෙස සනාථ වී තිබේ. 1987 දී පක්ෂයේ එවකට නායකයාව සිටි කීර්ති බාලසූරියගේ අකල් අභාවයෙන් පසුව, විජේ ඩයස්, විකොස ප්‍රධාන ලේකම් බවට පත්විය.

සසප විසින් ඉදිරි දිනවලදී සිය ක්‍රියාමාර්ගය හා ප්‍රතිපත්තීන් පැහැදිලිකරන මැතිවරන ප්‍රකාශනයක් පල කරනු ඇත. ශ්‍රී ලංකාවේද ආසියාවේද ජාත්‍යන්තරවද ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පාඨකයන්ගෙන් අප ඉල්ලා සිටින්නේ අපගේ මැතිවරන ව්‍යාපාරයට ක්‍රියාශීලීව සහභාගිවන ලෙසත් ආධාර කරන ලෙසත්ය. අපගේ මැතිවරන ප්‍රකාශනය බෙදාහැරීමට උදව් කරන්න, එය සිංහල, දෙමල හා ඉංග්‍රීසි භාෂාවලින් පල කෙරෙනු ඇත. අපගේ ප්‍රසිද්ධ රැස්වීම් වලට සහභාගි වන්න. සසප පාක්ෂිකයන්ට ඇමතිය හැකිවන පරිදි ඔබගේ වැඩපලවල හෝ ප්‍රදේශබඳව රැස්වීම් සංවිධානය කරන්න. අපගේ මැතිවරන අරමුදලට ආධාර කරන්න. සියල්ලටමත් වඩා අපගේ ක්‍රියාමාර්ගය හා ඉදිරි දර්ශනය බැරෑරුම්ව හදාරමින් පක්ෂයට බැඳීමට ඉදිරිපත් වන්න.

© www.wsws.org